# විශ්ව ගම්මානය




බොහෝ රටවල විශ්ව ගම්මාන, සයිබර් නගර දැන් බිහිවෙමින් පවතී. එදිනෙද ජීවිතයේ සෑම කාර්යයකට ම පරිගණකය හා අන්තර්ජාලය යොදාගත හැකි මෙම සයිබර් ගම්මානවලට බාහිර ලෝකයේ අනෙකුත් එවැනි ගම්මාන හරහා නිරන්තරයෙන් සම්බන්ධ විය හැකි තත්ත්වයක් දැන් උදාවෙමින් තිබේ. මේ සමග පළ වන්නේ එවැනි ගම්මානයක අනුරුවකි.

❶ මෙහි වීදි යටින් දිවෙන ප්‍රකාශ තන්තු කේබල මගින් එකිනෙකා යාකර ඇත. සෑම ගෙයක් ම, සෑම ගොඩනැගිල්ලක් ම, සාප්පු සංකීර්ණ, පාසල්, රෝහල් ආදී හැම එකක්මත් මෙම කේබල් ජාලයෙන් එකිනෙකා ඈඳ තිබේ. ❷ ඔබ වැඩකරන ආකාරය හා ජීවත් වන ආකාරය වෙනස් වේ.

❸ වර්තමානයේ ඇති පරිගණක මෙන් සිය වාරයක් වේගවත් පරිගණක පහසුකම සැපයේ. එම වයර තුළින් ම ඔබට ලාබදායී දුරකථන සේවාවක් හා වීඩියෝ පහසුකම් ලැබේ. ❹ ඔබේ ටෙලිවිෂනය සඳහා සිය ගණනක් අංකිත කේබල චැනල යා කළ හැකි වේ. ලොව ඕනෑම තැනක සිට පරිගණකය තුළින් ඔබේ නිවසේ මතු දැක්වෙන සියලුම කාර්යයන් දැකබලා ගත හැකි වේ. ❺ සොර සතුරු උවදුරු දැක්වෙන පද්ධතිය ❻ වායුසමීකරණ පද්ධතිය.

❼ ඒ අතර ඔබට ඔබේ නිදනකාමරය තුළ සිට කාර්යාලයේ කටයුතු කළ හැකි වේ.

❽ අසල්වැසියන් හා කෙරෙන සංවාද වෙනුවට අන්තර්ජාලයන් හරහා සංවාදයන් සඳහා එතෙර මිතුරන් හමුවිය හැක. ❾ ඊමේල් හෙවත් ඉලෙක්ට්‍රොනික තැපැල



මඟින් අන්තර්ජාලයේ "ඉන්ටර්නෙට්" හරහා ඔබට සාදයක් වුව සැලසුම් කළ හැකි ය.

10 ඔබේ නගරයේ ප්‍රසිද්ධ දැන්වීම් පුවරුවක දැන්වීමක් පළකර ළමයින් බලාගැනීමට ආයා කෙනෙක් ගෙන්වා ගත හැකි ය.

11 ජංගම දුරකථන මඟින් ප්‍රජාසේවාවන් හා කටයුතු කිරීමටත්,

12 බස්රථයක අසුනක් වෙන්කර ගැනීමට,

13 වැඩට යන අතරතුරදී ගමන් මාර්ගය ප් ළ් බ ද තොරතුරු හා තදබදය පිළිබඳ විස්තර දැනගත හැකි ය.

14 ළදරුවා දිවා සුරැකුම් මධ්‍යස්ථානයක දමා ආවා නම් ඒ ගැන තැවෙන ඔබට දරුවා එහි ගතකරන ආකාරය "වීඩියෝකැම්" මඟින් ඔබට දැකගැනීමට පුළුවන්.

15 බැංකු, සුපිරි වෙළඳසල්, සාප්පු, හෝටල, ලොන්ඩරි ආදී සියල්ල හා සමඟ සම්බන්ධකම් ඔබේ අනෙක් වැඩකටයුතු කරගන්නා අතර තුරදී ම කරගත හැකි ය.

16 ඔබට අවශ්‍ය සියල්ල ඔබේ දෙර ළඟට ම ගෙන්වා ගත හැකි ය.

17 රෝහල

18 පාසල ආදිය ද මේ ජාලයට එක් වෙයි. ඒ අනුව ඔබට වෛද්‍යවරුන්, ගුරුවරුන් හමුවිය හැකි ය. ඒසේ ම ඔබට දුරස්ථව අධ්‍යාපනය ලබන්නටත් ටෙලි වෛද්‍ය සේවයේ හා තාක්ෂණයේ සේවය ලබන්නටත් හැකි වේ.

19 ඔබේ දරුවා පාපන්දු වැනි ක්‍රීඩාවලට යොමු කරද්දී එහි එන අනෙක් දරුවන් හා ඔවුන්ගේ දෙමාපියන් කවුරුන්දැයි ඔබට නිවසේ සිට දැනගත හැකි යි.

පුරා අන්තර්ජාලය හරහා වෙන්දේසි අය ගැන ලබන කලාපයේ